# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**9 ශ්‍රේණිය**

## නාට්‍යය හා රංග කලාව

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2යි

### I කොටස

★ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01)වේදිකා නාට්‍ය කලාවේ විශේෂතාවකි.
1) වේදිකා නාට්‍ය කලාව සජීවී කලාවකි.
2) එය සාමූහික කලාවකි.
3) පෙළ සාහිත්‍යය මෙහි සුවිශේෂී ලක්ෂණයකි.
4) ඍජු ප්‍රේක්ෂක සහභාගිත්වය මෙයට අත්‍යවශ්‍ය සාධකයකි

02)රූපණ ශිල්පියෙකු සතු විය යුතු ගුණාංගයකි.
1) අන් අයගේ අදහස් ඉවසීම
2) කැපවීමෙන් කටයුතු කිරීම
3) කෙසේ හෝ තම අදහස් හා අවශ්‍යතාවයට අනුව රංගනයේ යෙදීම
4) දැඩි ආත්ම ශක්තිය හා නිර්මාණ කාර්යයට උපරිම සාධාරණයක් කිරීම

03)ක්ෂණික නිරූපණය යනු
1) පිටපතක් හෝ පෙර පුහුණුවීමක් නොමැතිව රඟ දක්වන්නකි.
2) රූපණ ශිල්පියාගේ පරිකල්පන ශක්තිය හා රංගන කුසලතාව දියුණු කරන්නකි.
3) රූපණ ශිල්පියා සතු නිර්මාණශීලීත්වය හෙළි කරන්නකි.
4) ඒකල වශයෙන් පමණක් සිදුකරන්නකි.

04)නළු කාර්යයේ දී නළුවාගේ සිරුර හා ඍජුවම සම්බන්ධවන අභිනයකි.
1) වාචික 2) ආංගික 3) සාත්වික 4) ආහාර්ය

05)නාට්‍යයක සංවාද අයත් වන්නේ
1) ආංගික අභිනයට යි 2) සාත්වික අභිනයට යි
3) වාචික අභිනයට යි 4) ආහාර්ය අභිනයට යි

06)නාට්‍යයක් රඟ දැක්වීම සඳහා යොදා ගන්නා විවිධ කලා අංග හඳුන්වනු ලබන්නේ
1) ලලිත කලා යනුවෙනි 2) සකල කලා යනුවෙනි
3) ප්‍රාසාංගික කලා යනුවෙනි 4) අනුශාංගික කලා යනුවෙනි

07)සාර්ථක නාට්‍යයක් බිහි වීමට නම් එහි වඩාත් වැදගත් වන්නේ
1) නාට්‍ය පෙළයි 2) නළුවා සහ නිළියයි
3) අධ්‍යක්ෂවරයායි 4) රංග ශාලාවයි

08)වචන නිරවුල්ව පැහැදිලිව ප්‍රකාශ කිරීම සඳහා සම්බන්ධ රංග අභ්‍යාසය වන්නේ,

1) ශිථිලකරණ අභ්‍යාස 2) කටහඬ අභ්‍යාස

3) මානසික අභ්‍යාස 4) දර්පණ අභ්‍යාස

09)කදාවළලු නාට්‍යය සඳහා පාදක කථා වස්තුව උපුටාගත් ජාතක කථාව වනුයේ

1) කාලගෝල ප්‍රශ්නයෙනි 2) නලපාන ජාතකයෙනි

3) ගෝලකාල ප්‍රශ්නයෙනි 4) සේරිවානිජ ජාතකයෙනි

10)කදවළලු නාට්‍යයේ සිටුදියණියගේ වස්ත්‍රාභරණ අයත් වන්නේ

1) ආංගික අභිනයට 2) බාහිර සමාරෝපයට

3) අභ්‍යන්තර සමාරෝපයට 4) සාත්වික අභිනයට

11)මනසින් යමක් මවා ගැනීම හඳුන්වනු ලබන්නේ

1) සංවාද නමින් 2) උපකල්පනය නමින්

3) නිරූපණය නමින් 4) පරිකල්පනය නමින්

12)නාට්‍ය පෙළක අනිවාර්යයෙන් අන්තර්ගත විය යුත්තකි.

1) ගැටුම 2) සංගීතය

3) අංගරචනය 4) ප්‍රේක්ෂක ප්‍රතිචාර

13)වචන භාවිතයෙන් තොරව මිනිස් සිරුර උපයෝගී කරගෙන කිසියම් සිද්ධියක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම.

1) අනුකරණය 2) අභිනය 3) අභිරූපණය 4) අභිප්‍රේරණය

14)අභිරූපනයේ දී භාවිතා නොකරන අභිනය

1) ආංගික අභිනය 2) වාචික අභිනය

3) සාත්වික අභිනය 4) ආහාර්ය අභිනය

15)හඬ අභ්‍යාස පුහුණු කිරීම සඳහා උපයෝගී කරගත හැකි ග්‍රන්ථයකි.

1) බුද්ධ ගජ්ඣය 2) සිරිත් මල්දමනය

3) නාට්‍ය ශාස්ත්‍රය 4) කාව්‍ය ශාස්ත්‍රය

**★ 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත ඇති ගොනුවෙන් අදළ පිළිතුරු තෝරා ලියන්න.**

**(ගායන හැකියාව/ දර්පන තල අභ්‍යාස/ සාත්වික අභිනය/ සතර අභිනය/ රිද්මයානු/ සමාරෝපය)**

16)චරිත අනුකරණය කිරීමේ දී ...................................... භාවිතා වේ.

17)නළුවා බාහිරව හා අභ්‍යන්තරව චරිතයට බවට පත්වීම ........................................ වේ.

18)ඇස් අතර සම්බන්ධතාවය පවත්වාගෙන යාමට ................................ වැදගත් වේ.

19)මනස මූලික කරගන්නා භාවයන් මුහුණෙන් ප්‍රකට කරවීම ............................................. වේ.

20)ශෛලිගත නාට්‍යයක් රඟපෑමේ දී නළුවෙක් සතුව .......................................... තිබිය යුතුය.

## II කොටස

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01)කෙටි පිළිතුරු සපයන්න.

1) කදාවළලු නාට්‍යය පළමු වරට රඟ දැක්වූයේ කවදා ද?
2) මෙම නාට්‍යයේ නිෂ්පාදකයා කවරෙක්ද?
3) මෙම නාට්‍යය හැර එතුමා විසින් නිර්මාණය කරන ලද තවත් නාට්‍ය දෙකක් ලියන්න.
4) මෙම නාට්‍යයේ වෙස් නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
5) මෙම නාට්‍යය නිර්මාණය වී ඇත්තේ කුමන ශෛලියකට අනුව ද?

02)

i. සමාරෝපය යනු කුමක්ද?
ii. සමාරෝපයේ ප්‍රභේද නම් කර කෙටි හැඳින්වීමක් කරන්න.
iii. හොඳ රූපණ ශිල්පියෙකු සතු ගුණාංග මොනවාද?

03)

i. නාට්‍ය ශෛලින් දෙකක් නම් කරන්න.
ii. එම නාට්‍ය ශෛලින්වල ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.
iii. නරඹා ඇති නාට්‍යයක් ඇසුරෙන් ශෛලින් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

04)

i. සතර අභිනය නම් කරන්න.
ii. සතර අභිනය විස්තර කරන්න.
iii. ඔබ නරඹා ඇති නාට්‍යයක සතර අභිනය යොදාගෙන ඇති ආකාරය උදාහරණ සහිතව විමසන්න.

05)

i. අනුෂාංගික අංග අයත් අභිනය කුමක්ද?
ii. අනුෂාංගික අංග හතරක් නම් කරන්න.
iii. අනුෂාංගික ශිල්පීන් වේදිකා නාට්‍යයකට දායක වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න.

06)

i. ගැටුම යනු කුමක්ද?
ii. ගැටුමේ ප්‍රභේද නම් කරන්න.
iii. ඔබ නරඹන ලද නාට්‍යයක් ඇසුරු කර ගනිමින් එහි දක්නට ලැබෙන ගැටුම් අවස්ථා පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.